# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1327/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 15/08/2024
පැය 1555

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2024.08.14 වන දින උදෑසන කාලයේ නාරම්මල පොලිස් වසමේ කඩහපොල කටුපොත මාර්ගයේ කඩහපොල ප්‍රදේශයේදී කටුපොත දෙස සිට නාරම්මල දෙසට මාර්ගය අයිනේ නවතා තිබූ කන්ටේනර් රථයක එම දිසාවට පැමිණි යතුරුපැදියක් ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු තුවාල ලබා නාරම්මල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක්වූ පරගහකොටුව, පහමුණේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - දිවුලපිටිය පොලිස් වසම.

2024.08.15 වන දින උදෑසන කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය මීගමුව මාර්ගයේ දුනුගහ හන්දිය ප්‍රදේශයේදී ගොඩිගමුව දුනුගහ මාර්ගයෙන් දිවුලපිටිය දෙසට ගමන් කිරීම සඳහා පැමිණි ත්‍රිරෝද රථයක් අධික වේගයෙන් ධාවනය කර රියදුරුට රථයේ වේගය පාලනය කර ගැනීමට නොහැකිව ත්‍රි රෝද රථය පෙරළී දිවුලපිටිය දෙස සිට මීගමුව දෙසට ධාවනය කළ ටිපර් රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රි රෝද රථයේ ගමන් ගත් පිරිමි පුද්ගලයින් තිදෙනෙකු මිය ගොස් ඇති අතර බරපතල තුවාල ලැබූ කාන්තාවක් වැඩිදුර ප්‍රතිකාර සඳහා ගම්පහ රෝහල වෙත ඇතුලත් කර ඇත. .

**මරණකරුවන් වයස අවුරුදු 30,38 හා 45 ක් වන ගොඩිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**